<u>**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**</u>

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

**ටෙන්ඩර් දැන්වීම - ‘‘එල්’’ කලාපයේ කුඩා හා මධ්‍ය පරිමානයේ වැව්වල රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය කිරීම**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ‘‘එල්’’ කලාපයේ කුඩා හා මධ්‍ය පරිමානයේ තෝරාගත් වැව්වල රොන්මඩ ඉවත් කිරීම හා එමගින් වැලි නිස්සාරණය කිරීමට (ගාස්තු අයකිරීමේ පදනම මත) තීරණය කර ඇත.

ඉහත කාර්යය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10, ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 09 මහලේදී **2026.03.20** දින **පෙ.ව. 11.00** වේලාව වන තෙක් ආයෝජකයින් තෝරා ගැනීමට මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| අංකය | කොන්ත්‍රාත් අංකය | වැඩ විස්තරය | තැම්පත්වූ රොන්මඩ ප්‍රමාණය ආසන්න වශයෙන් (කියුබ්) | ආපසු නොගෙවන ටෙන්ඩර් තැම්පතු මුදල (රු.) | පූර්ව ලංසු රැස්වීම |
|---|---|---|---|---|---|
| 1 | DDG/TS/CON/L/DESILT/41 | ‘‘එල්’’ කලාපයේ නිකවැව අමුණ ජලාශයේ රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 11,200 | 3,500.00 | දිනය - 2026/03/11<br>වේලාව - පෙ.ව. 10.00<br>ස්ථානය - නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය, එල් කලාපය,වැලිඔය. |
| 2 | DDG/TS/CON/L/DESILT/42 | ‘‘එල්’’ කලාපයේ නිකවැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 100,000 | 18,500.00 | |
| 3 | DDG/TS/CON/L/DESILT/43 | ‘‘එල්’’ කලාපයේ සපුමල් වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 14,000 | 4,000.00 | |
| 4 | DDG/TS/CON/L/DESILT/44 | ‘‘එල්’’ කලාපයේ ඇතාවැටුණුවැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 60,000 | 13,000.00 | |
| 5 | DDG/TS/CON/L/DESILT/45 | ‘‘එල්’’ කලාපයේ නිල්පොකුණ වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 21,000 | 5,500.00 | |
| 6 | DDG/TS/CON/L/DESILT/46 | ‘‘එල්’’ කලාපයේ සම්පත්වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 17,500 | 5,000.00 | |
| 7 | DDG/TS/CON/L/DESILT/47 | ‘‘එල්’’ කලාපයේ මොණරවැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 24,500 | 6,250.00 | |
| 8 | DDG/TS/CON/L/DESILT/48 | ‘‘එල්’’ කලාපයේ ටිකිරිවැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 17,500 | 5,000.00 | |

| අංකය | කොන්ත්‍රාත් අංකය | වැඩ විස්තරය | තැම්පත්වූ රොන්මඩ ප්‍රමාණය ආසන්න වශයෙන් (කියුබ්) | ආපසු නොගෙවන ටෙන්ඩර් තැම්පතු මුදල (රු.) | පූර්ව ලංසු රැස්වීම |
|---|---|---|---|---|---|
| 9 | DDG/TS/CON/L/DESILT/49 | “එල්” කලාපයේ ගජබාපුර වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 7,000 | 2,600.00 | |
| 10 | DDG/TS/CON/L/DESILT/50 | “එල්” කලාපයේ මායාවැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 7,000 | 2,600.00 | |
| 11 | DDG/TS/CON/L/DESILT/51 | “එල්” කලාපයේ කුරුළුවැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 17,500 | 5,000.00 | |
| 12 | DDG/TS/CON/L/DESILT/52 | “එල්” කලාපයේ කල්‍යාණපුර වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 24,500 | 6,250.00 | |
| 13 | DDG/TS/CON/L/DESILT/53 | “එල්” කලාපයේ සහන්වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 12,600 | 4,000.00 | |
| 14 | DDG/TS/CON/L/DESILT/54 | “එල්” කලාපයේ නෙළුම්වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 160,000 | 27,000.00 | දිනය - 2026/03/11<br>වේලාව - පෙ.ව. 10.00<br>ස්ථානය - නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය, එල් කලාපය, වැලිඔය. |
| 15 | DDG/TS/CON/L/DESILT/55 | “එල්” කලාපයේ කිරිඉබ්බන්වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 120,000 | 21,500.00 | |
| 16 | DDG/TS/CON/L/DESILT/56 | “එල්” කලාපයේ ඇහැටුගස්වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 90,000 | 17,000.00 | |
| 17 | DDG/TS/CON/L/DESILT/57 | “එල්” කලාපයේ හංසවිල වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 17,500 | 5,000.00 | |
| 18 | DDG/TS/CON/L/DESILT/58 | “එල්” කලාපයේ වැලි ඇල අමුණෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 56,000 | 12,500.00 | |
| 19 | DDG/TS/CON/L/DESILT/59 | “එල්” කලාපයේ හැළඹවැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 61,600 | 13,500.00 | |
| 20 | DDG/TS/CON/L/DESILT/60 | “එල්” කලාපයේ සාම උදා වැවෙහි රොන්මඩ ඉවත් කිරීම හා වැලි නිස්සාරණය. | 70,000 | 14,500.00 | |

මෙම කටයුත්තේදී ආයෝජකයින් විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව , මධ්‍යම පරිසර අධිකාරිය සහ භූ සමීක්ෂණ සහ පතල් කාර්යාංශයෙන් හා අනෙකුත් අදාළ ආයතන වල අනුමැතීන් අවශ්‍ය පරිදි ලබා ගත යුතුය.

ඉදිරිපත් කරනු ලබන ලංසු කොන්ත්‍රාත් පැකේජ වශයෙන් ඇගයීමට ලක් කරනු ලැබේ. ලංසුකරුවන්ට ඕනෑම එක් කොන්ත්‍රාත්තුවකට හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවකට ලංසු ඉදිරිපත් කිරීමට අවකාශ ඇත. ලංසුකරු, බහු පැකේජ සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී, එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙන් වෙන්ව ලංසු ඇපකර, යන්ත්‍ර සූත්‍ර, උපකරණ, සම්පත් යෙදවීම, පෙර පළපුරුද්ද හා සුදුසුකම් යනාදී උපමාණයන් පැහැදිලිව ඉදිරිපත් කල යුතුය.

කොන්ත්‍රාත් පැකේජ එකකට වැඩියෙන් අයදුම් කරනු ලබන ලංසුකරුවන් සඳහා, ඔවුන් විසින් අයදුම් කරනු ලබන සියලු කොන්ත්‍රාත් පැකේජයන් සාර්ථකව නිමකිරීමේ හැකියාව තීරණය කිරීම සඳහා ඔවුන්ගේ සමස්ත ධාරිතාව, සුදුසුකම්, යෝග්‍යතා උපමාණයන් සහ එක් එක් පැකේජය සඳහා සම්පත් වෙන් කිරීම යන කරුණු මත පදනම්ව ඔවුන්ගේ ලංසු ඇගයීමට ලක් කරනු ලැබේ.

සුදුසුකම් සහිත ආයෝජකයින් සමාගම් ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර මුදලින් ආපසු නොගෙවන ඉහත වගුවේ පරිදි ටෙන්ඩර් තැම්පත් ගාස්තුවක් ගෙවා කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 3 වන මහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) ගේ කාර්යයාලයෙන් මෙම කාර්යයන් සඳහා වූ ටෙන්ඩර් පත් කට්ටල ලබා ගත හැක. ටෙන්ඩර් පත් නිකුත් කරනුයේ **2026.03.05** දින සිට **2026.03.19** දින දක්වා පෙ.ව. 09.30 සිට ප.ව. 03.00 දක්වා පමණි.

කොන්දේසි සහ ලංසු සඳහා විස්තර ඇතුලත් ටෙන්ඩර් පත් කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 3 වන මහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) ගේ කාර්යයාලයෙන් **2026.03.05** දින සිට **2026.03.19** දින දක්වා වැඩකරන දිනයන්හි පෙ.ව. 09.30 සිට ප.ව 04.00 දක්වා කිසිදු ගෙවීමකින් තොරව පරීක්ෂා කල හැකි අතර **http//mahaweli.gov.lk** වෙබ් අඩවිය හරහාද ටෙනඩර් පත් පරීක්ෂා කල හැක..

කවරයේ ඉහල වම් කෙලවර ටෙන්ඩරයේ නම සහ අංකය පැහැදිලිව සඳහන් කර, මුල් පිටපත හා තවත් පිටපතකින් යුතුව කවරයේ බහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් **2026.03.20 දින පෙ.ව. 11.00** ට පෙර ලැබෙන සේ කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 9 වන මහලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය, නැතහොත් අතින් ගෙනවිත් භාර දිය යුතුය. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් පත් විවෘත කරන අතර ටෙන්ඩර් පත් ඉදිරිපත් කල ටෙන්ඩර්කරුද ඔහුගේ නියෝජිතයින්ද ඇතුළුව දෙදෙනෙකුට නොවැඩි වන සංඛ්‍යාවකට එම අවස්ථාවට සහභාගී විය හැක.

මෙම කාර්යයන් පිලිබඳ වැඩි විස්තර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, තාක්ෂණ සේවා අංශය වෙතින් ලබාගත හැක.

දූරකථන අංක 011-2689651, 011-2687475

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**